# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.09 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2789/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - පානදුර දකුණ පොලිස් වසම.**

2025.12.08 වන දින රාත්‍රී කාලයේ පානදුර දකුණ පොලිස් වසමේ වලාන පාර ප්‍රදේශයේදී පුද්ගලයෙකුට පහරදීමක් හේතුවෙන් තුවාල ලබා පානදුර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට පානදුර දකුණ පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ තුඩැල්ල, කඹුරුගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුදල් ආරවුලක් දුරදිග යාම හේතුවෙන් පුද්ගලයෙකු විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වයස අවුරුදු 54 ක් වන සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. පානදුර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. කොකේන් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වැලිගම පොලිස් ස්ථානය.**

2025.12.08 වන දින සවස් කාලයේ වැලිගම පොලිස් වසමේ වෙරළපාර මාර්ගයේදී වැලිගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කොකේන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 185 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 37 ක් වන ඉමදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් හා මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රාජගිරිය කඳවුර.**

2025.12.08 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කොස්ගස් හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා රාජගිරිය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 475ක් හා මත්කරල් 8000ක් සන්තකයේ තබාගෙන ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි**

සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. ගංජා හේන් දහයක් වැටලීම - කල්තොට පොලිස් ස්ථානය.

කල්තොට පොලිස් විශේෂ කාර්යංශයේ නිලධාරීන්ට හා රත්නපුර යුධ හමුදා බුද්ධි නිලධාරීන්ට ලද තොරතුරක් මත කල්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන් හා රත්නපුර යුධ හමුදා බුද්ධි නිලධාරීන් කණ්ඩායමක් එක්ව 2025.12.06 හා 2025.12.07 වන දින කල්තොට පොලිස් වසමේ උඩවලව රක්ෂිතයේ කිවුල ප්‍රදේශයේ අක්කර 10 ක පමණ භූමි ප්‍රමාණයක නීතිවිරෝධීව වගා කර තිබූ ගංජා හේන් 10ක් වටලා ගංජා පැල 275700ක් විනාශ කර ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කල්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. සැකකටයුතු මරණයක් - වැලිවේරිය පොලිස් වසම.

2025.12.08 වන දින උදෑසන කාලයේ වැලිවේරිය පොලිස් වසමේ වෑබඩ උතුර ප්‍රදේශයේ නිවසක් තුල පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් සිටින බවට වැලිවේරිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ වෑබඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැලිවේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වත්තල පොලිස් වසම.

2025.12.08 වන දින අළුයම් කාලයේ වත්තල පොලිස් වසමේ හැඳල ඇලකන්ද මාර්ගයේ හැඳල ප්‍රදේශයේදී ඇලකන්ද දෙස සිට හැඳල දෙසට ධාවනය කල ත්‍රීරෝද රථයක් මාර්ගයේ අයිනේ නවතා තිබූ කැබ් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු තුවාල ලබා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - ඉංගිරිය පොලිස් වසම.

2025.12.08 වන දින සවස් කාලයේ ඉංගිරිය පොලිස් වසමේ රත්නපුර පානදුර මාර්ගයේ බෝධිනාගල හන්දිය ආසන්නයේදී හොරණ දෙස සිට ඉංගිරිය දෙසට ධාවනය වූ යතුරුපැදියක මාර්ගය හරහා ගමන් කල පදික පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා හා යතුරුපැදිකරු තුවාල ලබා හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ කහව, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඉංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**